නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 199

ශ්‍රී. බු. ව. 2560 2017- ජනවාරි 12 දුරුතු කළාපය

# අඳුරු විපාක

## අති පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ නාහිමිපාණන් විසිනි

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

### අඳුරු විපාක

පින්වතුනි, අපි විස්තර කරන්න යන්නේ, සිත දූෂිත කරගෙන සිදු කරනු ලබන කුඩා අකුසලයෙන් නමුදු ගෙන දෙන විපාකයි අතිශයින් ඝෝර වූ කටුක වූ අමිහිරි වූ දුක් විපාකයන් බවය. වැරදි කරන අය මැරී ගොස් උපදින දුක් වැඩිම සැප අඩුම තැන සතර අපාය ලෙස හඳුන්වයි. නරකය, තිරිසන් යෝනිය, අසුර නිකාය, ප්‍රේත ලෝකය අපාය භූමි සතර වේ.

### නරකය

අප මේ සංසාරයේදී සතර අපාවලට වැටී විඳි දුක් ප්‍රමාණය සිතා නිම කිරීමටවත් නො හැකි තරම්ය. කෙනෙකු කොහේ ගියත් තමන්ගේ ම නිවසට ම ආපසු එන්නාක් මෙන්, තමන්ගේම නිවසේම නිතර වාසය කරන්නාක් මෙන්, ලෝක සත්වයා නිතරම යන්නේ අපායටමය. අපාය ලෝක සත්වයාගේ නිවහන බඳුය. සත්වයා ඒ අපාවල විඳි දුක් අනන්ත අප්‍රමාන වේ. වරක් අපායට වැටුනොත් ගොඩ ඒන්නේ බොහෝ කලකට පසුවය. පළමුවෙන්ම ඇති සංජීව නරකයේ මිනිස් ලොව අවුරුදු නව ලක්ෂයක් එහි එක් දවසකි. එවැනි දින 30 ක් මාසයකි. එවැනි මාස 12ක් අවුරුද්දකි. ඒ අනුව මිනිස් ලොව අවුරුදු ලක්ෂයේ ඒවා 3240 ක් සංජීව

නරකයේ අවුරුද්දකි. එවැනි අවුරුදු 500ක් එහි ආයු කාලය වේ. මේ මිනිස් ලොව අවුරුදුවලින් කියනවා නම් එහි ආයුෂ අවුරුදු ලක්ෂයේ ඒවා 1,620,000 කි. (900,000 30 × 12 × 500 )

සංජීව නරකයට යටින් ඇති නරකවල ආයු කාලය ඊටත් වඩා එන්න එන්නම වැඩිවේ. දෙවැනි කාලසූත්‍ර නරකයේ මෙහි අවුරුදු තිස්හය ලක්ෂයක් එහි එක් දවසකි. එවැනි අවුරුදු 1000 ක් එහි ආයුෂ කාලය වේ. මෙසේ ක්‍රමයෙන් යට යට ඇති නරකවල ආයු කාලය වැඩි වේ. අවීචියේ ආයුෂය කල්පයකි. එහි ආයු කාලය මෙහි අවුරුදු වලින් දැක්විය නොහැකිය. යොදුන් 84,000ක් දිග, පළල, උස ඇති මහා මේරු පර්වතය දිනකට එකවර බැගින් රෙදි කඩකින් පිස දමමින් ගිය විට මහා මේරු පර්වතය ගෙවී ගියත්. අවීචියේ ඇති ආයු කාලය. ගෙවෙන්නේ නැත. මේ තරම් අති දීර්ඝ කාලයක් අපායේ වැටී අපායේ ගිනි වලින් දැවෙමින්, ලෝහ ගුලි ගිලිමින් විඳිමට සිදුවන, දුක් හා වෙනත් කිව නොහැකි තරම් වූ අපා දුක් වලින් මුදාලන ප්‍රතිපත්ති දේශනා කල ඒ බුදුපියාණන් වහන්සේට එම ප්‍රතිපත්ති පූරණය කරමින් ප්‍රතිපත්ති පූජාවෙන් කොතෙක් නම් පූජා කල යුතු වන්නේ ද? ප්‍රධාන නිරයන් 08ක් තිබෙන අතර එම සෑම නිරයකටම ඔසුපත් නිරයන් 16 බැගින් ඇත. එවිට මුළු නිරයන් ගණන 136 කි. කුඩා නරකයෝ සතර වර්ගයකි. ගූථ නරකය, අසිපත්‍ර වන නරකය. කුක්කුල නරකය, සිම්බලී වන නරකයි.

<u>අටමහ නිරය</u>

1. **සංජීව නරකය : යමපල්ලන් විසින් එහි උපන් සත්වයන් ගිනියම් වූ පොළොවෙහි කෑලි කෑලි වලට කපද්දීත් ඒ සත්වයන් කර්ම බලයෙන් නැවත පීවත්වන බැවින් ඒ නිරය සංජීවය නම් වේ. අධික ක්‍රෝධයෙන් හා මානයෙන් අනුන් හා කෝළාහල කලෝ ද. දුබලයන් පෙළූ රජවරු හා නිලධාරීහු ද මැරයෝ ද සතුන් මරන්නෝ ද මෙහි උපදින්නාහ.**

2. **කාල සූත්‍ර නරකය : මෙහි උපන් සත්වයන් ගිනියම් වූ යම පොළොවේ පෙරලා දැලිනූල් ගසා සහින්නා වූ බැවින්**

කාලසූත්‍ර නරකය නම් වේ. මාපියන්ට හා මිතුරන්ටද ගුණවත් මහන බමුණන්ටද අපරාධ කල වුන් එහි දුක් විඳින්නාහ.

3 සංඝාත නරකය : මේ නිරයේ සත්වයන් නව යොදුන් ඝනකම පොලොවෙහි එරී නිශ්චලව සිටිති. එහි අහස ගුගුරන්නාක් මෙන් මහ හඬ නංවමින් එරී සිටින නිරි සතුන් අඹරමින් පර්වතයෝ ඒ මේ අත පෙරලෙති. ඒවාට යට වී සත්වයෝ සුණු විසුණු වෙති. ඇත්, අස්, ගව ආදී සතුන්ට වද දෙමින් වැඩ කරන්නෝ ද සතුන් මැරුවෝද එහි උපදිති.

4. රෞරව නරකය : මේ නිරයෙහි සත්වයන්ගේ ශරීර තුලට වැද ඇතුළත දවන්නා වූ නපුරු දුමක් ඇත්තේය. ඇතුලත පිටත දෙකම දවනු ලැබීමෙන් හඬනු ලබන නිරි සතුන්ගේ හඬ නිරතුරුව එහි ඇසෙන බැවින් එම නරකයට රෞරව නරකය යැ යි කියනු ලැබේ.

5. මහා රෞරව නරකය : අතිශයින් රෞද්‍ර වූ ගින්නේන් හා දුමින් තවනු ලබන සත්වයන්ගේ නිරන්තරයේ පවත්නා මහ හඬ ඇති නිසා ද නිරි සතුන්ගේ ශරීර වලින් ගලන ලෙයින් පිරී තිබෙන නිසා ද ඒ නරකය මහා රෞරව නම් වේ. තුණුරුවනට අයත් වූ ද මාපියන්ට අයත් වූ ද වස්තුව පැහැර ගන්නෝ ද විනාශ කල අය එහි උපදිති.

6. තාප නරකය : මේ නිරයේ යම පල්ලන් විසින් ගිනියම් වූ පොළවෙහි ගිනියම් වූ යහුල්වල අමුණන ලද සත්වයෝ ගින්නෙන් දැවෙමින් දුක් විඳිති. සතුන් පණ පිටින් දවා මැරුවෝ ද අනුන්ගේ ගෙවල් ගිනි තැබුවෝද එහි උපදිති.

7. ප්‍රතාප නරකය : මෙහි ද තාප නරකයෙහි නිරි සතුන් පැසෙන අයුරින් දීර්ඝ කාලයක් සත්වයෝ පැසෙති. මරණින් මතු ඉපදීමක් නැතැයි කියා මිත්‍යා දෘෂ්ටි ගෙන පව්කම් කල අය එහි උපදිති.

8. **අවීචි මහා නරකය :** මේ නරකයෙහි එක් බිත්තියකින් නැගෙන ගින්න අනෙක් බිත්තිය දක්වා ගමන් කරන්නේය. පොළොවෙන් නැගෙන ගිනි ජාලාව උඩ පියන්පත දක්වාද උඩ පියන් පතින් නික්මෙන ගිනි ජාලාව පොළොව දක්වා ද ගමන් කරන්නේය. සත්වයෝ නිතරම එම සදිසාවෙන් ම එන ගිනි දැල් වලින් වෙලී දැවෙන්නා හ. අතරක් නැතිව එහි සත්වයෝ වෙසෙති. ගිනිදැල් වලින් හා දුක් වලින් ද සත්වයන්ගෙන් ද අතරක් නැති බැවින් ඒ නරකය අවීචය නම් වේ.

මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, සංඝ භේදය. බුදුන්ගේ ඇගේ ලේ සෙලවීම, යන පංචානන්තරිය කර්ම කල වුන් ද, බෝසතාණන් වහන්සේලා ගේ ජීවිත නැසුවෝ ද, ගුණවතුන්ගේ පජීවිත නැසුවෝ ද, චෛත්‍යය බිඳින්නෝ ද, බෝ ගස් විනාශ කළ වුන් ද, රත්නත්‍රයට අයත් වස්තුව පැහැර ගන්නා වුන් ද, මිත්‍ර ද්‍රෝහීහු ද, භාර්යාවන්ට අපරාධ කලෝ ද, බොරු කීවෝ ද, සුරා පානය කළ වුන් ද, මිසදිටු ගැත්තෝ ද එහි උපදිති.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**